# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1. දෙපාර්තමේන්තුව : රජයේ ප්‍රවෘත්ති
යොමු අංකය : රප්‍ර/ආ11/02/02/001 දිනය : 2023.07.10

1.2. අමාත්‍යාංශය : ජනමාධ්‍ය
යොමු අංකය : MMI/AD2/12/1/81-Vol 1 දිනය : 2023.07.12

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/1134/V- II දිනය : 2021.08.31

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය
යොමු අංකය : EST-2/04/REC/3067 දිනය : 2023.06.28

1.5. ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය : NPC/06/31/91/SR දිනය : 2023.03.14

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය
යොමු අංකය : PSC/EST/04-01-28/02/2023 දිනය : 2023.07.27

02. පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :

පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/ අණදීම, කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූද, ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ කොටසක් වශයෙන් ගිනිය හැක්කාවූ කාර්යයන් ඉටු කරන නිලධර ගණයකි.

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය :

- මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කළ තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකමක් නොමැති තනතුරකි.
- මෙම පත්කිරීමේ කොන්ත්‍රාත් කාලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අතර, සේවයේ අවශ්‍යතාවය මත එම කාලය ඉකුත්වීමට පෙර වුවද පත්වීම අවලංගු කිරීමට එම කොමිෂන් සභාවට බලය ඇත.

- පත්වීම්ලාභියා විසින් රජය විසින් විටින්විට නියම කරන පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
- පත්වීම්ලාභියා තනතුරෙහි රාජකාරි භාරගත් වහා දෙපාර්තමේන්තු ප්‍රධාන සමඟ ප්‍රමාණාත්මකව මැනිය හැකි ඉලක්ක දැක්වෙන කාර්යසාධන ගිවිසුමකට එළඹිය යුතු අතර, ගිවිසගත් කාලසීමාව තුළ එම කාර්යසාධන ඉලක්ක සපුරාලීමට අපොහොසත් වුවහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම කොන්ත්‍රාත් පත්කිරීම අවසන් කරනු ඇත.

05. මාසික දීමනාව

I. මාසික දීමනාව : රු.88,000/-

II. ජීවන වියදම් දීමනාව : රු.7,800/-

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (කොන්ත්‍රාත්) | 01 | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අරමුණු හා මෙහෙවරට සමගාමී කාර්යභාරය ඉටු කිරීමෙහිලා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකාරිත්වයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාකාරකම් හා සැලසුම් ද ඇතුළු රජය සම්බන්ධ ඕනෑම ආකාරයක වැඩසටහන් හා සම්බන්ධ විවිධාකාර තොරතුරු ප්‍රචාරණයට අදාළ මාධ්‍ය හා සන්නිවේදන කටයුතු පිළිබඳ වගකීම් හා ඊට අදාළ කාර්යයන් ඉටු කිරීමට උපදේශන මඟ පෙන්වීම සහ විශේෂඥ දැනුම ලබා දීම |

07. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම් :

7.1 අධ්‍යාපන සුදුසුකම් : පහත දැක්වෙන භාෂා අතරින් දෙකක් ප්‍රධාන හා උපවිෂය වශයෙන් ඇතුළත් වූ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ) සාමාර්ථයක් සහිත විශේෂ උපාධිය

හෝ

පහත දැක්වෙන භාෂා අතරින් දෙකක් ප්‍රධාන හා උපවිෂය හෝ ප්‍රධාන විෂයයන් වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හා එම එක් භාෂාවක හෝ එම එක් භාෂාවක සාහිත්‍යය විෂයයෙහි පශ්චාත් උපාධියක්

සටහන I , භාෂා - සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි

7.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.3 පළපුරුද්ද : රජයේ මාධ්‍ය ආයතනයක් හෝ පිළිගත් වෙනත් මාධ්‍ය ආයතනයක විධායක මට්ටමේ I ශ්‍රේණියේ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ කළමනාකරණ කතෘ හා/හෝ ප්‍රධාන කතෘ තනතුරක වසර 6 කට නොඅඩු පළපුරුද්ද

7.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.5 වෙනත් : I. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට වෙබ්

nd

අඩවියේ / අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. සිංහල මාධ්‍ය අයැදුම්කරුවෙකු දෙමළ භාෂාව ද, දෙමළ මාධ්‍ය අයැදුම්කරුවෙකු සිංහල භාෂාව ද, ඉංග්‍රීසි මාධ්‍ය අයැදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ භාෂාවලින් එක් භාෂාවක් ද අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ප්‍රධාන විෂයයක් ලෙස සමත් වීම (දෙවන භාෂාව ලෙස හෝ වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ) විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

08. වයස :

8.1 උපරිම වයස : අවුරුදු 67 ට නොවැඩි

09. බඳවා ගැනීමේ ක්‍රමය :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ

9.1 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් -

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I. අමතර අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 25 | ජනමාධ්‍ය, ජනසන්නිවේදනය හෝ මාධ්‍යකරණය යන ක්ෂේත්‍රවල පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය - ලකුණු 25<br>පාඨමාලා පාදක පශ්චාත් උපාධිය - ලකුණු 15<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 10<br>ඩිප්ලෝමාව - ලකුණු 05<br>සටහන :<br>I. සියලු පශ්චාත් උපාධි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් |

| | | |
|---|---|---|
| | | විශ්වවිද්‍යාලයකින් ලබා ගෙන තිබිය යුතුය. වෙනත් උපාධි ප්‍රදාන ආයතනවලින් ලබා ගත් උපාධි එම කොමිෂන් සභාව විසින් පිළිගෙන තිබිය යුතුය. ඩිප්ලෝමාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් ආයතනයකින් ලබා ගෙන තිබිය යුතුය. <br>II. ඉහළම සුදුසුකමට පමණක් ලකුණු හිමි වේ. |
| II. පළපුරුද්ද | ලකුණු 20 | වසර 6කට වැඩි ඉහත 7.3 වගන්තියෙහි දක්වා ඇති ආකාරයේ පළපුරුද්ද |
| III. භාෂා ප්‍රාගුණ්‍යය | ලකුණු 20 | සිංහල මාධ්‍ය අයැදුම්කරුවෙකු දෙමළ භාෂාව ද, දෙමළ මාධ්‍ය අයැදුම්කරුවෙකු සිංහල භාෂාවෙහි ද ප්‍රවීණතාවය <br>- ලකුණු 15 <br>සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාවය <br>- ලකුණු 05 |
| IV. පරිගණක දැනුම | ලකුණු 15 | මාධ්‍යකරණයට හා ජනමාධ්‍යයට අදාළ නවීන පරිගණක යෙදවුම් පිළිබඳ දැනුම |
| V. අදාල ක්ෂේත්‍රය තුල සිදු කල විශේෂ ව්‍යාපෘති | ලකුණු 15 | ක්ෂේත්‍රයේ ජාතික වශයෙන් පිළිගත් සම්මාන <br>- ලකුණු 15 |
| VI. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | ලකුණු 05 | නායකත්වය, ආකල්ප, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතා <br>- ලකුණු 05 |

සටහන :

I. ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත්, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කෙරෙනු ඇත. එය අයදුම්පත් කැඳවීමේ නිවේදනය සමඟ ප්‍රසිද්ධ කළ යුතුය.

II. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ

9.1.1 : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

9.2 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**10.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි** : අදාළ නොවේ

**11.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ** : අදාළ නොවේ

**12.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ

**13.** මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනම් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ

| **සකස් කළේ** :- | | **පරීක්ෂා කළේ** :- | |
|---|---|---|---|
| අත්සන | : ...................................... | අත්සන | : ...................................... |
| නම | : ඩබ්.ඒ.පී.එස්.පෙරේරා | නම | : යූ.පී.එල්.ඩී.පතිරණ |
| තනතුර | : සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (පාලන II) | තනතුර | : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| දිනය | : 2023.08..10..... | දිනය | : 2023.08. .11..... |

ඩබ්. ඒ. පී. සංදීප පෙරේරා
සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ (පාලන II)
ශ්‍රී ලංකා පරිපාලන සේවය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05

යූ. පී. එල්. ඩී. පතිරණ
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

අත්සන : ......................................

නම : දිනිත් චින්තක කරුණාරත්න

තනතුර : රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2023.08. 15....

නිල මුද්‍රාව :

දිනිත් චින්තක කරුණාරත්න
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**14.** **අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ:**

යොමු අංකය : MMD/ADM/12/1/81 - VOl I

2023.07.27 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන :

නම :

ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය

දිනය : 2023. 08 . 21

නිල මුද්‍රාව :

**15.** **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :**

යොමු අංකය : PSC/EST/04-01-28/02/2023

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා වන කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.07.27 දින අනුමත කරන ලදී.

අත්සන :

නම : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2023. 09 . 27

නිල මුද්‍රාව : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල